# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1711/8 - 2011 ජුනි 21 වැනි අඟහරුවාදා - 2011.06.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 937 දරන සුරාබදු නිවේදනය

**ස්වභාවය වෙනස් නොකරන ලද, පානීය සහ විකිණීම සඳහා අදහස් කරන බෝතල් ගත කරන ලද මත්පැන් අපනයනය**

කලින් කළට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) (අ) වැනි උපවගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය යටතේ ජනාධිපති විසින් සාදන ලද නියෝගය යි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජුනි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*නියෝගය*

සුරාබදු ආඥා පනතේ 12 වැනි වගන්තිය යටතේ, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන අවසර පතක් මත කරන ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල් ගත කරන ලද මත්පැන් අපනයනය, සුරාබද්දක් ගෙවීම මත හෝ බදු රහිත පදනමක් මත එම භාණ්ඩ අපනයනය සඳහා ඇපකරයක් හෝ බැංකු ඇපයක් හෝ සැපයීම මත අවසර දෙන බව ද, එම ඇපකරය හෝ බැංකු ඇපය සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පිළිගත හැක්කක් විය යුතු බවද මෙයින් නියම කරමි.

මෙම නිවේදනයේ කාර්යයන් සඳහා ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල් ගත කරන ලද මත්පැන් අපනයකරුවන් සුරාබදු බලපත්‍රධාරීන් ලෙස සලකනු ලබන අතර, ඔවුන්ට නිෂ්පාදකයන්ගෙන් හෝ තොග වෙළෙන්දන්ගෙන් අපනයනය සඳහා ඔවුන්ගේ ඉහත සඳහන් ගණයට අයත් මත්පැන් මිලදී ගැනීමට අවසර දෙනු ලැබේ. අපනයනකරුවන් බදු රහිත අනුග්‍රහයට හිමිකම් ලැබීමට ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල් ගත කරන ලද මත්පැන් අපනයනයෙන් දින 30 ක් ඇතුලත මෙහි උප ලේඛනයේ යොමු කර ඇති සියළුම ලියකියවිලි සුරාබදු කොමසාරිස් ජනරාල් සෑහීමකට පත්වන පරිදි සැපයිය යුතු ය. වක්‍ර අපනයනකරුවන් සම්බන්ධයෙන් පමණක් අදාල ලියකියවිලි ඉදිරිපත් කිරීමේ කාල සීමාව දින 60 ක් වන්නේය. මෙලෙස ලියකියවිලි ඉදිරිපත් කිරීමට අසමත්වීමේ දී අපනයනකරුවන් ඔවුන්ට පනවනු ලබන දඬුවම් කිසිවකට අමතරව, පවත්නා බදු ප්‍රමාණයන්ට අනුකූලව සුරාබදු ගෙවිය යුතු වන්නේ ය.

2005 අප්‍රේල් මස 01 වැනි දින අංක 1386/31 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 878 දරන සුරාබදු නිවේදනය පරිච්ජින්න විය යුතු ය.

*උපලේඛනය*

1. අපනයනය කල ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල් ගත කරන ලද මත්පැන් සඳහා ඉන්වොයිසියක්.
2. නෞභාර පත්‍රය හෝ ගගණ මාර්ග පත්‍රය.
3. රේගු අපනයන පත්‍රය.

07-296